*Proceedings of the 8th Academic Sessions, University of Ruhuna 2010*
*Vol. 8 pgs 130 – 138*

**CF - 02**

# මාතර දිස්ත්‍රික්කයේ විල්පිට රක්ෂිත වනාන්තරය ඇසුරින්, වනාන්තර සංරක්ෂණය සඳහා බලපාන සාම්ප්‍රදායික ඇගයීම්, ඇදහිම්, විශ්වාස පිළිබඳ අධ්‍යයනයක්

**කුමාර, එම්.පී.පී.**

*භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර, ශ්‍රී ලංකාව.*

✉ dimuthu_g@yahoo.com

**සාරා සංක්ෂේපය**

ලෝකයේ වනාන්තර හා සම්බන්ධ ඇදහීම්, විශ්වාස හා ඇගයීම් වනාන්තර සංරක්ෂණය උදෙසා බොහෝ සේ උපකාරී වී තිබේ. මෙම සංකල්පයන් බොහෝමයක් ලංකාවේ ජෛව පද්ධති සංරක්ෂණය වීම උදෙසා අතීතයේ සිට බලපා තිබේ. ශ්‍රී ලංකාවේ බොහෝ නිවර්තන වැසි වනාන්තර හා සම්බන්ධ සංරක්ෂණ ක්‍රියාවලියේදී මෙම සංකල්ප පැවතීම මගින් වනාන්තරය තුළ නොඉදුල් බව රැකී තිබේ. මෙම අධ්‍යයනය සඳහා මාතර දිස්ත්‍රිකයේ කඹුරුපිටිය හා අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් විල්පිට රක්ෂිත වනාන්තරය තෝරා ගන්නා ලදී. මෙමගින් බලාපොරොත්තු වූයේ වනාන්තර සංරක්ෂණය උදෙසා සාම්ප්‍රදායික ඇදහිලි, ඇගයීම් හා විශ්වාස කොතෙක් දුරට බලපා ඇති ද යන්න අධ්‍යයනය කිරීම වන අතර ඊට අමතරව ක්‍රමයෙන් අතීතයේ සිට නූතන පරම්පරාව දක්වා ගමන් කරන විට මෙම සංකල්පයන් හීන වී යාම අධ්‍යයනයට ලක් කිරීමද අරමුණු විය. ලෝකයේ වර්තමානය වන විට වනාන්තර ක්ෂය වී යාම බරපතල ගැටලුකාරී තත්වයක් ලෙස හඳුනා ගත හැක. එමෙන්ම එවා පාලනය කිරීම පිණිස පියවර ගෙන තිබුනත් එවායේ සංරක්ෂණ ක්‍රියාදාමයන් වලට වඩා ප්‍රජාවට සමීපව ඔවුන් තුළින් අදහස් මගින් නොදැනුවත්වම මෙම සංරක්ෂණ ප්‍රවේශය යොදා ගැනීම ඉතා වැදගත් සංකල්පයක් වේ. එමෙන්ම මේ වන තෙක් මේ හා සම්බන්ධ පර්යේෂණ විරල වූ අතර අතීතයේ සිට මිනිසා රැකරැත් වනාන්තරය වර්තමාන දක්වා සංරක්ෂණයට පාදක වූ හේතු කාරණා කුමක්ද යන්න විමසීම මෙමගින් ඉටු කළ හැකි කාර්යයකි. එමෙන්ම මේ වන තෙක් වනාන්තර සංරක්ෂණ ක්‍රියාදාමය පාලනය කළ නොහැකි වීම මෙහි පර්යේෂණ ගැටලුව ලෙස පෙන්වා දිය හැකිය.

මෙම අධ්‍යයනය තුළින් සොයා ගත් ඇදහිම් හා ඇගයීම් මූලික වශයෙන් වර්ගීකරණයකට පාත්‍ර කරන ලදී. එනම් වනය හා බැදි පවතින විශ්වාසයන්, ශාක හා සතුන් හා බැදි පවත්නා විශ්වාසයන්, ජලය හා භූමිය සමග බැදි පවතින විශ්වාසයන් ලෙසය. එමගින් මෙකී අදහස් හා බැදි සංස්කෘතිය තුළ තිබූ සංරක්ෂණ ක්‍රමෝපායන් තුල පවතින තාර්කික බව ඉස්මතු වේ. එමෙන්ම එය වර්තමානය දක්වාම මිනිස් චින්තනයේ පවතින සංකල්පයක් බවත් එ නිසාම වන්නට මිනිසා හා පරිසරය අතර තිබෙන සුහදත්වය, බැදියාව තවදුරටත් වර්ධනය වී ඇති බව තර්කනය කළ හැක.

මෙම පර්යේෂණය මූලික වශයෙන්ම ගුණාත්මක පර්යේෂණ වර්ගයට අයත් වන අතර අදාළ දත්ත ලබා ගැනීම සඳහා යොදා ගත්තේ ගුණාත්මක දත්ත ලබා ගැනීමේ ක්‍රමවේදයන් වේ. එ අතරට සිද්ධි අධ්‍යයන, සම්මුඛ සාකච්ඡා, ඉලක්කගත සම්මුඛ සාකච්ඡා, අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා යනාදිය තෝරා ගන්නා ලදි. එ සඳහා සිද්ධි අධ්‍යයන 10 ක් පමණ අදාළ ක්ෂෙත්‍රයෙන් ප්‍රජාවගෙන් ලබා ගන්නා ලදී.

මේ තුලිනුත් අප කළ පර්යේෂණය මගින් ප්‍රජාවගේ බොහෝ අදහස් හා ඇගයීම් ශාක හා සත්ව ප්‍රජාව මෙන්ම ජලය ආරක්ෂා කිරීම සඳහා යෙදෙන බව නිගමනය කළ හැක. එ අතර වනාන්තරයට ප්‍රවේශයට පෙර අත්තක් කඩා ගසේ එල්ලා දෙවියන්ගෙන් අවසර ඉල්ලීම, නුග ගස් වන්දනාමාන කරමින් අවසානයේ ආරණ්‍යයක් දක්වා එය පැතිරීම සිදු වීම, ජල මූලාශ්‍රවලට දේවත්වයෙන් සැලකීම සත්ව දඩයමේ දි ගැබ්බර සතුන් නොමැරීම හා මොණරුන් මැරීම පාපයක් සේ සැළකීම, මෙම විශ්වාස තුළ මුලික් වේ. ඊට අමතරව ගස් වැල් වල පිහිටීම හා සම්බන්ධ විශ්වාසයන් හා විල්පිට වැව නිර්මාණය වීමේ දී එහි ජල මූලාශ්‍ර හරස් නොකර වැවෙන් පමණක් ජලය ලබා ගැනීමට මිනිසුන් තුළ පවතින පුරුදු මෙහිදි වැදගත්ය. එමෙන්ම මේ තුළින් වනාන්තරය හා අතීත ප්‍රජාව කෙරෙහි ඉතාම සමීපවන්ත බැඳීමක් තිබීම හේතුවෙන් මෙම වනාන්තර රැක ගැනීමට හැකි වී තිබෙන බව තහවුරු කළ හැකිය. එසේ වුවත් වර්තමාන තුන්වන පරම්පරාව මෙම සංකල්පයන් කෙරෙහි පවතින උනන්දුව ඉතාම අඩු මට්ටමක පවතින බව අප පර්යේෂණය තුළින් සනාථ විය. 1980 දශකය තුළ වනාන්තරය හෙළිම ආරම්භ වීමත් සමග මෙම සංකල්පයන් වියකි යාමට මූලික වශයෙන් හේතු වී ඇති අතර එවා ක්‍රමයෙන් ප්‍රජාව වෙත යළි ලබාදීම තුළ මෙය සංරක්ෂණ ප්‍රවේශයක් ලෙස ගොඩනැගිය හැකි මාවතක් ලෙස දැක්විය හැකි.

ඒ අනුව මෙම රක්ෂිතය සංරක්ෂණය කිරීමේ කාර්ය සඳහා ප්‍රජාව හා බැදි ආකල්ප විශ්වාස, ඇදහිලි යන සංකල්ප බොහෝ සේ දායක වී ඇති බව නිගමනය කළ හැක.

**යතුරු පද:** ග්‍රාමීය ප්‍රජාව, වනාන්තර සංරක්ෂණය, ප්‍රජාවගේ ඇදහිලි ඇගයීම් හා විශ්වාස, අතීත පරම්පරාව

## හැඳින්වීම

මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය හා අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් වන විල්පිට රක්ෂිත වනාන්තරය හෙක්ටයාර 460 පමණ වපසරියකින් යුත් යෝජිත සංරක්ෂිත වනාන්තරයකි. මෙය මාතර දිස්ත්‍රික්කයේ ජෛව විවිධත්වයෙන් වැඩිම වනාන්තරයයි. මේ ආශ්‍රිතව ලේනබටුව වැව පිහිටා ඇත. විල්පිට වනාන්තරය තුළ ඇති ශාඛ විශේෂ වලින් 58% ශ්‍රී ලංකාවෙට ආවේණික වන අතර එය ආවේණික සත්ව විශේෂ වලින් ද යුක්ත වේ. මේ වනාන්තරය තුල වැඩි වපසරියක් පයිනස් වගාව හා ඒ හා සම්බන්ධ විදේශීය ශාකවලින් යුක්ත වේ. 1965 දී රජය විසින් වනාන්තර කපා දැව සඳහා යොදා ගන්නා ලදී. එම අවධියේ දී විල්පිට වනාන්තර දැව හෙලීමට භාවිතා කල අතර පසුව දැව හෙලීම නතර කරන ලදී .පසුව හෙක්ටයාර 30ක පයිනස් වගාව ව්‍යාප්ත කර ඇත .මෙම වනාන්තරය 1949.09.08 දින ගැසට් අංක 8497 න් රක්ෂිත වනාන්තරයක් බවට පත්කර ඇත . මෙම වනාන්තරයේ පයිනස් පත්‍ර භූමිය මත දිරා නොයා දිගු කාලයක් පැවතීම නිසා භූමිය මත තෙවන ශාක ප්‍රජාවක් නිර්මාණය වීමට බොහෝ කාලයක් ගත වේ. එම නිසා යටි රෝපණයන් දක්නට නොමැත (දකුණු පළාත් සැලසුම් ලේකම් කාර්යාලය, 2000).

වන හායනය දිනෙන් දින වැඩිවෙමින් පවතින අතර මෙය ලංකාවට පමණක් නොව ලෝකයටම පොදු වූ ගැටළුවක්ව පවතී. වන කළමනාකරණය කර එය අනාගත පරපුරට රැක ගැනීම සඳහා රජය විසින් විවිධ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ගෙන ඇත. ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ලංකාව පුරා ක්‍රියාත්මක වුවද නිසියාකාරව වන කළමනාකරණය සිදුවේද යන්න ගැටළුවකි. මේ සඳහා මිනිස් ප්‍රජාවගේ දායකත්වය දැනුවත්ව හෝ නොදැනුවත්ව යම් ආකාරයකට ලැබේ. වන කළමනාකරණය හා සම්බන්ධ ලෝකය පුරා විවිධ අත්දැකීම් ඇගයීම් හා විශ්වාස පවතී. ලංකාවේද මේ සඳහා විවිධ ඇදහිලි හා විශ්වාස පවතී. මෙම ඇදහිලි හා විශ්වාස වන කළමනාකරණය සඳහා කොතරම් දුරට දායක වේද යන්න සොයා බැලීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. මේ පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා අප තෝරා ගත්තේ විල්පිට රක්ෂිතයයි. වන කළමනාකරණය හා බැඳුණු ඇදහිලි හා විශ්වාස ලෝකය පුරාම දැකිය හැකි තත්වයකි. වනාන්තර ආරක්ෂා කිරීමට බොහෝ පියවර මේ ඔස්සේ ලබාගෙන තිබේ. මෙහි දී සියැටෙල් ප්‍රකාශය ඉතා වැදගත් සේ සැලකිය හැකිය.

"මේ මහ පොළවේ සෑම බිම් අඟලක්ම මාගේ ජනතාවට පූජනීය සුවිශුද්ධය. ළහිරු එළියෙන් බැබලෙන දේවදාර ගස්වල සෑම සිසිල් පත්‍රයක්ම පුලින තලයන්ගෙන් වැසුනු වෙරල තීරයක්ම සෑම ජීවියෙක්ම වාගේ ජනතාවගේ චිත්ත සන්තානයන් ද අත්දැකීම් සමුදායේ ද ශුද්ධ වස්තු පවතී. (සියැටල් ප්‍රකාශය, විජයරත්න, 2002, 18)"

වනාන්තර සංරක්ෂණය කිරීමට සාම්ප්‍රදායික ආකල්ප සෘජුවම බලපෑම් කොට ඇති බැව් පහත කෘතියේ සඳහන්වේ.

"ගහට පොත්තත් පොත්තට ගහත් වගේම මිනිසාට වන සම්පත් වනයට මිනිසාත් බැදිල හිටියා. මේ නිසාම වන සම්පත් නාගරීකරණය නොවුනු ගම්වල ඇත්තන්ට කප්රුකක් කිව ද වරදක් නෑ (පොඩි අප්පුහාමි, 2002, 32)."

ඒ අනුව වනාන්තරය සංරක්ෂණයෙහිලා සාම්ප්‍රදායික දැනුම විශ්වාස ආකල්ප සෘජුවම බලපාන බව සඳහන් කල හැකි අතර එය වනාන්තර ආරක්ෂා වීමට ද බලපාන බව සඳහන් කළ හැකිය.

## ක්‍රම වේදය

මෙම පර්යේෂණය සිදුකරන ලද්දේ ගුණාත්මක පර්යේෂණ ක්‍රම යොදාගනිමිනි. ඒ අතර ගුණාත්මක පර්යේෂණ දත්ත ලබාගැනීම සඳහා මූලික වශයෙන් සිද්ධි අධ්‍යයන 10 ක් යොදාගත් අතර ඊට අමතරව සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලි යොදාගන්නා ලදී. එවැනි ක්‍රම ඔස්සේ ප්‍රාථමික දත්ත ක්ෂේත්‍රයට ගොස් ලබාගත් අතර ද්විතියික දත්ත ලබාගැනීමේදී ආයතනික තොරතුරු හා මූලාශ්‍ර අන්තර්ජාලය හා පොත්පත් විශේෂයෙන් යොදාගන්නා ලදී. ඒ අතරට රුහුණ විශ්වවිද්‍යාලයේ පොත්පත් හා සඟරා යොදාගත් අතර එමගින් පර්යේෂණ සඳහා අවශ්‍ය මූලික තොරතුරු ලබාගන්නා ලදී. මෙම පර්යේෂණය සිදු කරන ලද්දේ ගුණාත්මක පර්යේෂණ ක්‍රම යොදා ගනිමින් වන අතර ඒ සඳහා වැඩිපුරම යොදාගන්නා ලද්දේ ගුණාත්මක තොරතුරු ලබාගන්නා ප්‍රවේශයන් වේ.




**දත්ත ඉදිරිපත් කිරීම හා විශ්ලේෂණය**

වනාන්තර සංරක්ෂණය සඳහා සාම්ප්‍රදායික ඇදහිලි හා විශ්වාස වල බලපෑම පිළිබඳ විල්පිට රක්ෂිතය ඇසුරින් අධ්‍යයනය සිදුකළ අතර ඒ සඳහා දත්ත රැස් කිරීමේ ක්‍රම වේදය යටතේ ගුණාත්මක ප්‍රවේශය යොදාගන්නා ලදී. ඒ යටතේ සිද්ධි අධ්‍යයන 12 කින් පමණ දත්ත ලබා ගත් අතර එසේ ලබාගන්නා ලද තොරතුරු ඇදහිලි හා විශ්වාසයන් අනුව පහත පරිදි වර්ගීකරණය කළ හැක.

01.වෘක්ෂලතා හා සම්බන්ධ ඇදහිලි හා විශ්වාසයන්

02. වන සතුන් හා සම්බන්ධ ඇදහිලි හා විශ්වාසයන්

03. ජල මූලාශ්‍ර හා සම්බන්ධ ඇදහිලි හා විශ්වාසයන්

04. වනාන්තරය ඇතුළුවීම සම්බන්ධව ඇති විශ්වාසයන්

05. භූමිය හා සම්බන්ධ ඇදහිලි හා විශ්වාසයන්

**වෘක්ෂලතා හා සම්බන්ධ ඇදහිලි හා විශ්වාසයන්**

විල්පිට රක්ෂිත වනාන්තරය තුල ප්‍රජාවගේ ආකල්ප හා ඇදහීම් වෘක්ෂලතා හා සම්බන්ධව විශේෂයෙන් කැපී පෙනේ. මූලික වශයෙන් වනාන්තරය තුල පිහිටි බොහෝ ශාක ප්‍රමාණයක පැවැත්ම තහවුරුවීමට හේතු වී ඇත්තේ මෙම විශ්වාසයන් හා ඇදහිලි තුලිනි. එමෙන්ම ප්‍රජාව තුළ පවතින ආකල්ප නිසාද බොහෝ සේ මෙම ජෛව සම්පත් ආරක්ෂා වී ඇති බව කැපී පෙනෙන කරුණකි.

මේ සිද්ධි අධ්‍යනය තුලින් පැහැදිලි වන පරිදි වනාන්තරයට ප්‍රවිශ්ට වීමට පෙර කොළ අත්තක් කඩා එල්ලීම කරනු ලබන්නේ ආරක්ෂාව ලබාගැනීම සඳහාය. එනම් ඒ තුලින් මිනිසුන් තුළ පවතින සත්ව හා ශාක පිළිබඳ භය පෙන්නුම් කෙරේග මෙලෙස අයියනායක දෙවියන්ට භාර වී කැලයට පිවිසෙන්නේ මං මුලා වැල පෑගී ගමන් මග වෙනස් මගකට නොයේවායි පතමිනි. ඒ නිසාම ශාක හෙලීමේ ක්‍රියාවද නොකරන ලදී. අත්‍යවශ්‍ය බෙහෙත් බඩු හැරුණු විට විශාල ගස් කැපීමට ඔවුන් තුළ බියක් තිබුණි. ඊට හේතුව කැලේ තුළ පිරිත් කියන ශබ්ද ඇසීමයි. ඒ නිසා වනාන්තරය තුළට මිනිසුන් ප්‍රවිශ්ඨ වීමට යම් කිසි බියක් තිබුණි. ඒ නිසාම ජෛව පද්ධතිය නොදැනුවත්වම ආරක්ෂාවී ඇත. මිනිසුන් තුළ පවතින ආගමික චින්තනය නිසා එයට දක්වන ගෞරුත්වය නිසා මිනිස්සු ශාක හෙලීමට මැලි කමක් දක්වති. ඒ නිසා වනාන්තරය තුළ පිහිටි ශාක ආරක්ෂා විනි. ඒ අතර හොර නුග ශාක නා යනාදිය වැදගත් වේ. ඊට හේතුව ආගමික චින්තනයයි. එනම් බුදුන් වහන්සේ පිටදී බුදු බව

ලබාගත්. ශාකය හෙලීම පාපයක් ලෙස ඔවුන් සැලකූහ. ඒ නිසාම එවැනි වටිනා ශාක බොහෝමයක් ආරක්ෂා විය.

සිද්ධි අධ්‍යයන අංක 1

නම : කේ. පී. ජෝතිපාල මහතා
වයස : අවුරුදු 58
ගම : ලේනබටුව
රැකියාව: ඉඩම්හිමි වැවිලිකරු
පදිංචිය : උපන්දා සිට
අධ්‍යාපනය: විදිමත් අධ්‍යාපනයක් ලබා නැත.

"මේ කැලේ කලුවර ඇටබල හොර බදුල්ල අළුබෝ උගුරුකුණා ගස් තියෙනවා උගුරුකුණා ගහේ ලී මැරෙන්නේ නෑ. 1970 ගණන්වල කොන්ත්‍රාක් කාරයෝ ගස් කපන කොට නම් ගස්වලට වැදුම් පිදුම් කළේ නෑ. ඉස්සර නම් කැලේට යන්න ඉස්සෙල්ලා අතරමං නොවන්න අත්තක් ගහක එල්ලන සිරිතක් තිබුණා. මේ කැලේ මැද ලොකු හොර ගහක් තියෙනවා. කවුරුත් ඒක කපන්න යන්න බයයි. ඉස්සර කැලේ පිරිත් කියන සද්දේ ඇහුනලු. ඒ හින්ද කවුරුත් කැලේට හානි කළේ නෑ.නුග ගස් නා ගස් කපන්නෙම නෑ. දර කිට්ටුවෙන් තඩා ගන්නවා".

එමෙන්ම විශේෂයෙන් බදුල්ල වැනි ශාක වලින් සිරුරට සිදුවන හානියන් නිසා ඒවා කපා දැමීම පාලනය විය. ඒනම් බදුල්ල ශාකය කැපීමෙන් හා අතේ ගෑවෙනවිට ආසාද්මිකතා හට ගැනීමයි. ඒ නිසාම ඒවැනි ශාක කපා දැමීම හෝ ඉවත් කිරීම පාලනය විය. අදටත් ඔවුහු තෙවන පරම්පරාව තුල දිවි ගෙව්ව ද මෙවැනි ශාක කපා නොදමති.

එමෙන්ම විල්පිට රක්ෂිතය ආශ්‍රිතව පවතින ආරණ්‍ය සේනාසනය හා සම්බන්ධ වූ පදනම මෙහිදී වැදගත් වේ.

නුගගස්, නාගස් ආදී දෙවියන් අරක්ගත් ශාක ඉතිරි කර ඒවාට වන්දනාමාන කිරීම තුළින් ඒවා ආරක්ෂා කිරීම සිදු විය එමෙන්ම එවැනි ශාක කපා දැමීම පාලනය කර එය අවසානයේ ආරණ්‍යයක් දක්වා වර්ධනය වුනි. එයට හේතු වූ පසුබිම ආගමික චින්තනය ඔස්සේ මිනිසුන් මෙවැනි ශාක ආරක්ෂා කරගනිමින් ඒවාට ගරුත්වයක් ආරෝපණය කිරීමයි ඒ නිසාම මෙම ශාක ප්‍රජාවන් වනාන්තරය පුරාවටම ආරක්ෂා වී තිබේ. අනෙකුත් අවශේෂ ශාක වර්ගවලට වඩා වැඩි ආගමික ආරෝපණයක් මෙවැනි ඇදහීම් හා විශ්වාස කිසියම් අවම වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කලද අතීත සිරිත් විරිත් හා බැඳි මිත්‍යා විශ්වාස තුළ පවතින දර්ශනය වනාන්තර සංරක්ෂණය කෙරෙහි නොදැනුවත්වම දායක වී තිබේ.

සිද්ධි අධ්‍යනය අංක 2

නම : එම් .සී. සුමතිපාල මයා
වයස : අවු: 68
ගම : ගලගාව දෙනිය
රැකියාව : ඉඩම්හිමි වැවිලි කරු
පදිංචිය : උපන්දා සිට
අධ්‍යාපන මට්ටම: අට සමත්

"මහත්තයෝ ගලගාව දෙනිය ගමේ එහා කෙලවරේ නුග ගහ ලග දිය බිබුලක් තියෙනවා. ඒ නුග ගහට අපේ මුතුන් මිත්තන්ගේ කාලයේ ඉඳලම වැඳුම් පිදුම් කළා. ඒ ගහට අරක්ගත් දෙවියෙකුත් ඉන්නවලු. ඒ නිසාම එතැන ආරණ්‍ය සේනාසනයක් හදලා තියෙනවා. අපි ගහක් කපන කොට ගහට වැඳ ආචාර කරනවා. ඒ වාගේම බුදුන්වන විට උපකාර කළ ගස් නිසා බෝගස් අපි කපන්නේ නෑ."

සිද්ධි අධ්‍යනය අංක 3

නම : එල්. පියදාස මහතා

වයස : අවු: 66

ගම : ලේනබටුව

රැකියාව : ඉඩම්හිමි වැවිලි කරු

පදිංචිය : උපන්දා සිට

අධ්‍යාපන මට්ටම : අ: පො : ස (සා: පෙ) දක්වා

"මේ කැලේ ලොකු නුග ගහක් තිබුනා.ඒ ගහට කවුරුවත් හානි කළේ නෑ.දවසක් ගහ කපන්න ගියාම ඒ කෙනා ගහෙන් වැටුනා කියලා කතාවක් ගමේ තිබුනා. සමහර පෝය දවස්වලට මේ නුගගහ ළඟින් දේවතා එළියනවා කියලා මිනිස්සු කියනවා. මේ නිසා ඒ කැලේ මිනිස්සු නුගගහට පහන් තිව්වා කියලා කතාවක් තියෙනවා."

මෙවැනි සිද්ධි අධ්‍යයන තුළින් පවා පැහැදිලි වන්නේ විල්පිට රක්ෂිත වනාන්තරය තුළ පවතින ජෛව ප්‍රජාව ආරක්‍ෂා කිරීමට ප්‍රජාවගේ ආගමික පසුබිම කොතරම් දුරට බලපා තිබේද යන්නයි ඒ නිසා විශේෂයෙන් ශාක සංතතිය ආරක්‍ෂා වුනි. ඒ ඔස්සේ වනාන්තරය සංරක්‍ෂණ යන සංකල්පය මිනස් චින්තනයට එක් වේ. එම දැහැමි ආකල්ප බුදු දහම හා බැදී පවතී. ඒ නිසාම මෙම ශාක වලට ගරුත්වය ආරෝපනය කිරීම මිනිසා තුළ පැවති විශිෂ්ට ගති ලක්‍ෂණයක් ලෙස සැලකිය හැකිය.

මෙම වෘක්‍ෂලතා හා සම්බන්ධ සිද්ධි අධ්‍යයන් සලකා බැලීමේදී නුග, බෝ, නා, රුක් අත්තන වැනි ශාකවලට මිනිසුන් තුළ දැඩි විශ්වාසයක් පැවැතී ඇති බව කිව හැකිය. මේ ගස්වල දෙවියෝ සිටිනවා යැයි ආකල්පයක් ඇති බැවින් ගස් ආරක්‍ෂා කරන ලදී. මෙය වන සංරක්‍ෂණය කිරීමේ අරමුණින් තොරව සිදු වුවද සිදුව ඇත්තේ තිරසර සංවර්ධනයයි. මිනිසුන් තුළ පැවති විශ්වාස ඇදහිලි ආගමික භක්තිය ඊට පසුබිම් වියග විල්පිට වනාන්තරය ආශ්‍රිතව සිටි පළමු පරම්පරාව ආගමික පසුබිම මත දැඩිව ජීවත් වූ බවත් එය වෘක්‍ෂලතා ආරක්‍ෂා වීමට පසුබිම් විය. වර්තමාන පරපුර වෙතින් මෙම විශ්වාසයන් ගිලිහී යමින් පවති.

සිද්ධි අධ්‍යනය අංක 4

නම : පී .සාමෙල් මහතා

වයස : අවු:76

ගම : ගලගාව දෙනිය

රැකියාව : යන්ත්‍ර මන්ත්‍ර කටයුතු කිරීම

පදිංචිය : උපන්දා සිට

අධ්‍යාපන මට්ටම : විධිමත් අධ්‍යාපනයක් ලබා නැත.

"කැලේ මංමුලා වැල් තියෙනවා ඒවා පෑගුනොත් කැලේ අතරමං වෙනවා. නුග, නා, බෝ රුක්අත්තන ගස්වල දෙවියෝ ඉන්නවා. ඒක හින්දා ඒවා කපන්නේ නෑ. දෙයියන්ගේ ලෙඩ හැදුනම අපි ඉස්සර නුග නා බෝ ගස්වල පඬුරු ගැට ගැහුවා"

## වන සතුන් හා සම්බන්ධ ඇදහිලි හා විශ්වාසයන්

විල්පිට වන රක්ෂිතය තුළ සිටින බොහෝ සතුන් ආරක්‍ෂා වීමට මිනිසුන්ගේ ඇදහිලි හා විශ්වාස පසුබිම් වී ඇතග ආගමික වශයෙන් ලද අභාෂයන් අතීතයේ සිට පැවති විශ්වාසයනුත් මීට පසුබිම් විය.

සිද්ධි අධ්‍යනය අංක 5

නම : එස් .ටී. පී. විතානආරච්චි මහතා

වයස : අවු :72

ගම : බිබුලේවෙල

රැකියාව : ගොවිතැන

පදිංචිය : උපන්දා සිට

අධ්‍යාපන මට්ටම: 8 සමත්

"සත්තු මරන්න කඳන් බැඳීම කරනවා. ඒ වුනාට පොඩි පැටවු හමුවුනොත් බේරා අරිනවා.දැන්නම් සත්තු මරනවා අඩුයි. ඉස්සර සතෙක් මරන්න ඉස්සෙල්ලා ඊට අධිගෘහිත රාක්‍ෂයන්ට හා දේවතාවන්ට කන්නලව් කරනවා. සත්තු රංචු විදියට හිටියොත් මරන්නෑ".

වන සතුන් හා සම්බන්ධ ඇදහිලි හා විශ්වාස සලකා බැලීමේදී වන සතුන්ට ඇති බයත් වන සතුන් පිළිබඳ ඇති ආකල්පත් නිසා වන සතුන්ට හානි කිරීමට මිනිසුන් පෙලඹෙන්නේ නැත. ගැබ්බර සතුන් නොමරන්නේ ඉන් තමන්ගේ ජීවිතවලටද යම් හානියක් වේ වැයි සිතන නිසාය. එසේම සතුන් මැරීම පාපයක් ලෙසආගමික වශයෙන් මිනිසුන්ට ආකල්ප ගොඩ නගා ඇත.

සිද්ධි අධ්‍යනය අංක 6

නම : වී. සී . ඉන්දික මහතා

වයස : අවු: 40

ගම : බිබුලේවෙල

රැකියාව : තැපැල් නිළධාරී

පදිංචිය : උපන්දා සිට

අධ්‍යාපන මට්ටම: අ:පො:ස උසස් පෙළ

"ඉස්සර ඉඳන් අපි අහලා තියෙනවා නයි මරන්නෑ කියලා. නයි ගැන එක එක විශ්වාස තියෙනවා. නයින්ට ගෞරවයෙන් සලකනවා. නයෙක් දැක්කොත් උෟට කරදරයක් කරන්නෑ. එක නයෙක් මැරුවොත් නයි හතක් එනවා කියනවා. තව මොනරු අලි වගේ සත්තු මරන්නේ නෑ. ඒ මොනර කතරගම දෙවියන්ගේ වාහනය විදියට සලකන නිසා ගැබ්බර සත්තු අහුවුනත් මරන්නෑ බේරලා යවනවා."

මිනිසුන් වන සතුන් මරනවා යන අදහසින්ම නොව සතුන්ට ඇති බිය ඒ පිළිබඳව පවත්නා විශ්වාසයන් නිසාවෙන් එවැනි කටයුතු සඳහා පෙළඹී නැත. ගැබ්බර සතුන් නොමැරීම තුළ සත්ව පරම්පරා ඉදිරියට වර්ධනයට මිනිසුන් නොදැනුවත්වම දායක වී පවතී. මින් සිදුව ඇත්තේ තිරසර වර්ධනයයි. විල්පිට රක්‍ෂිතය ආශ්‍රිත ජනතාවද වන සතුන් ආරක්‍ෂා කරනවා යන අදහසින් ආරක්‍ෂා කළා නොවේ. විවිධ ආකල්පයන් විශ්වාසයන් සතුන්ට ඇති බිය නිසා වන සතුන් ආරක්‍ෂා කිරීමට පෙළඹුනු බව අපට විශ්ලේෂණය කළ හැකිය. බුදු දහමෙන් ලද ආගමික පසුබිමද ඊට හේතු වී ඇත.

සිද්ධි අධ්‍යනය අංක 7

නම : එස් .අයි . ජයසේකර මහත්මිය

වයස : අවු: 65

ගම : ලේනබටුව

පදිංචිය : උපන්දා සිට

අධ්‍යාපන මට්ටම : 8 සමත්

"මේ කැලේ තියෙන වැව ලේනබටුව වැව. ඉස්සර අය වැවෙන් වතුරගන්න ගියාම වැවට වදිනවලු. ඒ වගේම වතුරට කෙල ගහන්නෙත් නෑ. මීට ටිකක් එහා දිය බුබුලක් තියෙනවා . ඒකට බැස්සොත් පහළට ඇදගෙන ගිහින් බිලිගන්නවා කියලා මිනිස්සු කියනවා. කවුරුත් ඒක කිලිටු කරන්නෑ. කිරි අම්මන් දොළ ළඟත් හොල්මන් තියෙනවලු. අවේලාවට ගියාම හොල්මන් පේනවා. ඒ හින්දා මිනිස්සු ඒ හරියට යනවා අඩුයි."

ජල මූලාශ්‍ර හා සම්බන්ධ ඇදහීම් හා විශ්වාස සලකා බලන විට මෙම වනාන්තරය ආශ්‍රිතව ඇති ලේනබටුව වැව ප්‍රදේශයේ ජනතාව හොඳින් රැකගෙන ඇත. ඒ ජලය ආශ්‍රිතව තිබූ ආකල්ප නිසාය. බීමට ජලය ලබා ගන්නා වැව දිය බුබුල ආදී ස්ථාන අපවිත්‍ර නොකළේ ඒවාට ගරුත්වයෙන් සැලකූ නිසාය.

එසේම මේ ආශ්‍රිතව පිවත් වූ අතීත පරම්පරාව ජලයට කෙලගැසීම පපායක් ලෙස සැලකීය . එසේම ජල මූලාශ්‍ර ආශ්‍රිතව අදෘශ්‍යමාන බලවේග පවතී යැයි පැවැති ආකල්පයන් නිසා නොදැනුවත්වම ප්‍රජාවගෙන් ජල මූලාශ්‍ර ආරක්‍ෂා වීම සිදුවිය. අතීතයේ සිට පැවති වැව අපවිත්‍රවීම අවම මට්ටමකට පැවතීමට මිනිසුන් තුළ පැවති ආකල්පයන් හා විශ්වාසයන් හේතුවිය. වර්තමාන පරපුරට වැව සංරක්‍ෂණය වී ඇත්තේ සාම්ප්‍රදායික විශ්වාසයන්ට ප්‍රජාවගේ ඇති බැඳීම නිසාවෙනි.

**වනාන්තරයට ඇතුළුවීම සම්බන්ධව ඇති විශ්වාසයන්**

සිද්ධි අධ්‍යයනය අංක 8

නම : වයි .කේ . ලතා මහත්මිය

වයස : අවු: 86

ගම : ලේනබටුව

රැකියාව : නැත

පදිංචිය : උපන්දා සිට

අධ්‍යාපන මට්ටම : විධිමත් අධ්‍යාපනයක් ලබා නැත.

"ඉස්සර අපේ වැඩිහිටියෝ කැලේට යන්න ඉස්සෙල්ලා අයියනායක දෙවියන්ගෙන් ආරක්‍ෂාව ඉල්ලනවා. ඒකට ගහක අත්තක් එල්ලල යන්නෙ. මේ කැලේට අධිපති දෙවියෝ රජ්ජුරු බණ්ඩාර හා අයියනායක ඊශ්වර දෙවියන්. කැලේට යන අයට ආරක්‍ෂාව අවසර දෙන්න කියලා දෙවියන්ගෙන් ඉල්ලනවා."

සිද්ධි අධ්‍යනය අංක 9

නම : එන් . එල් බස්නායක මහතා

වයස : අවු: 79

ගම : යහමුල්ල

රැකියාව : ඉඩම්හිමි වැවිලිකරු

පදිංචිය : උපන්දා සිට

අධ්‍යාපන මට්ටම : 5 සමත්

" ඉස්සර අපි පොඩිකාලේ ඔය කැලේට ගියේ ගස්වල පඬුරු ගැට ගහලා. ගොඩාක් වෙලාවට පඬුරු ගැට ගහන්නේ නා, බෝ, රුක්අත්තන ගස්වල. එහෙම කළේ කැලේට යන්න ආරක්ෂාව ලබාගන්නයි."

වනය පිලිබඳව බොහෝ පිරිස් වෙතින් ප්‍රකාශ වන්නේ බියකරු ස්වභාවයකි. ඒ නිසා වනය තුළට ඇතුළුවීමට පවා බිය විය. එම නිසා වනාන්තරයේ වෘක්ෂලතාවලටල සතුන්ට හානි පැමිණවීමට මෙම ප්‍රදේශවාසීන් පෙළඹී නැති බව මින් පෙනී යයි.

මේ නිසා අදවන විටත් විල්පිට රක්ෂිතය සංරක්ෂණය වෙමින් පවතී. එහෙත් මෙහි පළමු පරම්පරාව වනය සංරක්ෂණය කරනවා යන අරමුණින් මෙය ආරක්ෂා නොකළ බව අපට පෙනීයයි . ඔවුන්ගේ සමාජයීය සාම්ප්‍රදායික චර්යා අනුව වනාන්තරය ආරක්ෂාවට පෙළඹී ඇති බව සිද්ධි අධ්‍යයනවලින් පැහැදිලි වේ.

**භූමිය හා සමබන්ධ ඇදහිලි හා විශ්වාසයන්**

සිද්ධි අධ්‍යයන අංක 10

නම : එම්. ටී. සුමනදාස මහතා

වයස : අවු 70

ගම : ලේනබටුව

රැකියාව : වඩුවැඩ

පදිංචිය ; උපන්දා සිට

අධ්‍යාපනය : 5 සමත්

"ඉස්සර කැළේ මොනවට හරි වලක් කපනවා නම් වල කපන්න උදැල්ල ගන්න කොටම අපි උදැල්ලටයි පොළවටයි වඳිනවා .මේ හරියෙ ඉස්සර ඉඳල හිටල මැණික් ගරනවා. එහෙම මැණික් ගරනකොට මැණික් ගරන්න ඉස්සෙල්ල පහන් පැලක් හදල මල් පූජා කරල තමන් ආරක්ෂා කරන්න කියල අයදිනවා."

මෙම සිද්ධි අධ්‍යයනය තුලින් පැහැදිලි වන්නේ මෙම ප්‍රදේශයේ මිනිසුන් භූමිය සමග ඉතා සමීපව බැඳී සිටි බවයි. තමන්ට අවශ්‍ය සියලු දේ ලබාදෙන නිසා මිනිසුන් භූමියට සැලකුවේ දැඩි ගරුත්වයෙනි. ඒ නිසා භූමියෙන් ප්‍රයෝජන ගැනීමේදී එයට හානියක් නොකර ප්‍රයෝජනයට ගැනීම දක්නට ලැබුණි. ඒ තුළ ඇත්තේ තිරසර සංවර්ධන සංකල්පයකි.

මෙම සියලුම සිද්ධි අධ්‍යයන තුලින් පැහැදිලි වන්නේ මිනිසුන් තුළ පවත්නා සාම්ප්‍රදායික විශ්වාස සහ ඇදහිලි තුළින් ඔවුන් නොදැනුවත්වම වනාන්තර සංරක්ෂණයට දායක වී ඇති බවයි. ඒ අනුව තිරසර සංවර්ධන සංකල්පයක් අතීතයේ සිටම පැවති බව පැහැදිලි වේ.

අතීතයේ ජීවත් වූ පළමු පරම්පරාව විසින් විල්පිට වනාන්තරත් ඒ හා බැඳී ලේනබටුව වැවත් අනාගත පරම්පරාවට තිරසාරාත්මකව දායාදාකර ඇති බව පැහැදිලි වේ. නමුත් එය පළමු පරම්පරාව නොදැනුවත්වමම සිදුකල දෙයකි. ඒ සඳහා ආගමික පසුබිම මත පදනම් වූ සාම්ප්‍රදායික ඇදහිලි හා විශ්වාස හේතු වන්නට ඇත.

වර්තමානය වන විට විල්පිට වනාන්තරය ආශ්‍රිතව ජීවත්වන තෙවන පරම්පරාව සාම්ප්‍රදායික ඇදහීම් සහ විශ්වාස පිලිබඳ එතරම් සුභවාදී ආකල්පයක් නැති බව අපගේ අධ්‍යයනයෙන් පැහැදිලි විය.

## නිගමනය

අපගේ පර්යේෂණයෙන් තහවුරු වූ පරිදි වනාන්තර සංරක්‍ෂණය උදෙසා ප්‍රජාව තුළ පවතින විශ්වාස ආකල්ප, ඇදහීම්, ඇගයීම් බලපා ඇති බව සඳහන් කල හැකිය. මෙම සංකල්ප අතීත පරම්පරාවල සිට කෙමෙන් වර්තමාන පරම්පරා දක්වා විකාශනය වීමේදී අඩුවීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි. එමෙන්ම වනාන්තරය හා බැදි ප්‍රජාව බොහෝ දුරට මෙම සංකල්ප කෙරෙහි සැලකිලිමත් වෙමින් නොදැනුවත්වම වනාන්තර සංරක්‍ෂණ ක්‍රියා මාලාවට යොමු වී ඇති බව පෙනී යයි. එමෙන්ම එය ඔලියගන් රක්‍ෂිතයේ ජෛව ප්‍රජාව ආරක්‍ෂා වීම කෙරෙහිත් මිනිසාත් පරිසරයත් තුලනාත්මක බැදීමක් පෙන්නුම් කරන බව සඳහන් කළ හැකිය. ඒ නිසාම අතීත ප්‍රජාව වනාන්තරය දේවත්වයෙන් සැළකූ අතර වර්තමානය වන විට වනාන්තර සංරක්‍ෂණ ක්‍රියාදාමය සඳහා වන සංරක්‍ෂණ දෙපාර්තමේන්තුවටත් වන ජීවී දෙපාර්තමේන්තුවටත් විශාල වගකීමක් දැරීමට සිදු වී තිබේ. එසේ වන්නේ ප්‍රජාවගේ ආකල්ප හා ඇදහීම් වියකී යමින් පවතින නිසා වන අතර එය තවදුරටත් අතීත රාමුව මත පිහිටා මෙම වනාන්තරය සංරක්‍ෂණය කිරීමට ප්‍රජාවගේ ආකල්ප වර්ධනය කළ යුතු බව තර්කනය කළ හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


දකුණු පළාත් සැළසුම් ලේකම් කාර්යාලය - දකුණු පළාත් සභාව (2000) "කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය"

පොඩි අප්පුහාමි, කේ.බී. (2002). "රජරටින් ගිලිහීයන ගැමි ජීවන රටා", එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

විජේරත්න, එල්. බී. (2002). "අසිරිමත් හෝර්ටන් තැන්න", විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, මුල්ලේරියාව.

සුමනසිරි, ඒ.එල්. (1999) "බුදු දහමයි පරිසරයයි", එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

හේරත්, කේ, එස්. (2000)"සමාජය හා මිනිස් ආකල්ප", රත්නවල ප්‍රින්ටර්ස්, කෑගල්ල.